# “සුවපත් මිහිතලයක් උදෙසා -
# ලෝක මිහිතල දිනය”

(2020 අප්‍රේල් 22)

වර්තමානයේ සමස්ථ ලෝකයේම අවධානය යොමුව ඇත්තේ කොරෝනා වයිරසය කෙරෙහිය. ලොව පුරා වේගයෙන් පැතිරයන මෙම වයිරසය මගින් මේ වනවිටත් අති විශාල මිනිස් ජීවිත සංඛ්‍යාවක් මෙලොවින් තුරන් කර ඇත. එසේම සාමාන්‍ය ජන ජීවිතය අඩාල කරමින් මිලියන ගනනක ජනතාවක් අසරණ තත්ත්වයට පත්කර ඇත. මෙම තත්ත්වය පාලනය සඳහා නිරෝධායන කටයුතුවල සිට සහන සේවා සැපයීම දක්වා විශාල ධනස්කන්ධයක් වැයකිරීමට ලොව පුරා රටවලට සිදුව ඇත. කොරෝනා වයිරසය හේතුවෙන් වර්තමානයේ ඇතිවී ඇති බරපතල සෞඛ්‍ය ගැටළුවට අමතරව ඉදිරියේදී ලොවට මුහුණදීමට සිදුවන සමාජ ආර්ථික ගැටළු රැසක් පිළිබඳ පුරෝකථනයන් ද විද්වතුන් විසින් ඉදිරිපත්කර ඇත.

කොරෝනා වයිරසය විසින් ලොව පුරා දැවැන්ත අරබුදකාරී තත්ත්වයක් නිර්මාණය කර ඇති අතර බොහෝ රටවල් එහි අම්හිරි අද්දැකීම් විදිමින් ඇත. මෙම උද්ගතව ඇති තත්ත්වය හමුවේ පරසරය අතින් යම් ධනාත්මක තත්ත්වයන් නිරික්ෂණය වී තිබීම ද සුවිශේෂිය ලක්ෂණයකි. දැනට ලැබී ඇති වාර්තා අනුව ලොව වායු දූෂණය සැලකිය යුතු අගයකින් පහළ වැටී ඇති බව අනාවරණය වේ. විශේෂයෙන් දකුණු ආසියාතික කලාපය සැලකීමේදී ඉන්දියාවේ නවදිල්ලි නගරය ආශ්‍රිතව වායු දූෂණයේ සැලකිය යුතු අඩුවීමක් 2020 අප්‍රේල් මස මුල වාර්තාවිය. එමෙන්ම ලොව වඩාත් ජනාකීර්ණ හා කාර්යබහුල නගරවල වායු දූෂණය විශාල වශයෙන් පහල ගොස් ඇති බවත්, ඕසෝන් වියන ස්වභාවිකව පිලිසකර වෙමින් ඇති බවත්, හරිතාගාර වායූන් ඇතුළුව පරිසරයට එකතුවන විවිධ දූෂකාරක ප්‍රමාණය අඩුවී ඇති බවත් වාර්තා විය. එසේම, නාගරික පරිසරයෙන් දුරස්වූ සමහර සත්ත්ව විශේෂ නැවතත් නාගරික පරිසරවල සැරිසරන අයුරු දක්නට ලැබුණි. මේ සියල්ලගෙන්ම නැවත නැවතත් පැහැදිලි වන්නේ මිනිසා මිහිතලයේ ධාරිතාවය ඉක්මවා එහි සමතුලිත බවට හානිකරමින් තම කටයුතු සිදුකර ඇති බවයි. නමුත් දැන් මානව ක්‍රියාකාරකම් නවතාලමින් මිහිතලය නැවතත් සුවපත් වෙමින් ඇත.

එසේම සොබාදහම විසින් මිනිසාට කියාදුන් පාඩමට හිස නමමින් ලොව රටවල් කීපයක් මේ වනවිටත් තම රටවල පිහිටි වනාන්තර, වනජීවීන්, ගංගාවන් ආරක්ෂා කිරිමටත් ඒවාට මිනිසුන් සතු අයිතීන් ලබාදීමට පියවර ගැනීමත් ප්‍රසංශනීය ක්‍රියාවකි.

මෙම පසුබිම මත මිහිතලය කෙරෙහි වඩාත් සංවේදී වන්නට, මිහිතලය වෙත කාරුණික වන්නට, මිහිතලය සුරැකීමේ වගකීම දරන පුරවැසියකු වන්නට අවස්ථාව අපට උදාවී ඇත. ඒ මිහිතලයට ගරු කරන්නට වෙන්ව ඇති “ලෝක මිහිතල දිනය” මෙම අප්‍රේල් 22 දිනට යෙදී ඇති බැවිනි. 2020 ලෝක මිහිතල දිනය ඉතිහාසයේ අන් කවරදාටත් වඩා සුවිශේෂිය වන්නේ අපරික්ෂාකාරී මානව ක්‍රියාකාරකම් හේතුවෙන් හානියට පත් මිහිතලය ස්වභාවධර්මය විසින්ම නැවතත් සුවපත් කරන සමයක අපට එය සමරන්නට සිදුවීමයි.

## ලෝක මිහිතල  දිනයේ ඉතිහාසය

1969 වසරේදී ඇමරිකා එක්සත් ජනපදයේ සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර පැවති යුනෙස්කෝ ආයතනයේ සමුළුවේදී එවකට ප්‍රකට සාම ක්‍රියාකාරීයෙකු වූ ජෝන් මැක්කොනෙල් මහතා විසින් සාම සංකල්පය සමග මිහිතලයට ගරුකිරීම සඳහා දිනයක් යෝජනා කරන ලදී. පළමු වරට මෙම දිනය මිහිතල දිනය ලෙස 1970 වසරේ මාර්තු මස 21 දින උතුරු අර්ධගෝලයේ රටවල්  විසින් සමරා ඇත. පසුව ඇමරිකා එක්සත් ජනපදයේ පරිසරය හා සම්බන්ධ විද්වතෙකු වූ සෙනෙට් සභික  ගෙලොර්ඩ් නෙල්සන් මහතා විසින් 1970 වේ අප්‍රේල් මස 22 දින මිහිතල දිනයක් වශයෙන් සමරා ඇත. එලෙස ඇමරිකා එක්සත් ජනපදය විසින් මිහිතල දිනය සමරන අවස්ථාව වනවිට ඒ සඳහා ලෝක මිහිතල දින ජාලය (World Earth Day Network) නමින් සංවිධානයක් ද පිහිටුවා ගන්නා ලදී. මිහිතල දිනය සැමරීමේ මූලික අරමුණවී ඇත්තේ නිරෝගී, තිරසාර පරිසරයක් උදෙසා කැපවීමයි. පිරිසිදු වාතය, පිරිසිදු ජලය හා වඳවීමේ තර්ජනයට ලක්වූ ජීවී විශේෂ පිළිබඳව සැලකිල්ල යොමුකිරිම ද මෙම පළමු මිහිතල දිනය පාදක කරගනිමින් ඇතිවිය.

## ලෝක මිහිතල දිනයේ සුවිශේෂීයතාවය

ලෝක මිහිතල දිනය පරිසර ආරක්ෂාව මුල්කරගනිමින් ඇති වූ දිනයකි. එමෙන්ම  1970 දී ආරම්භවී පරිසරය පිළිබඳ ගෝලීයව ජනතා  ක්‍රියාකාරීත්වයක් ශක්තිමත්ව ස්ථාපිත කල අවස්ථාවකි. පරිසරය පිළිබඳව ජනතාව දැනුවත් කිරිම සඳහාත්, පරිසර ක්‍රියාකාරකම් සඳහා යොමුවීම සඳහාත් විවිධ සම්මන්ත්‍රණ, ජනතාව සහභාගීවන ආචාර පෙළපාලි, පෙත්සන් අත්සන් කිරීම, පරිසරය පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන, රුක් රෝපණ වැඩසටහන්, පරිසරය සුරකින බවට ප්‍රතිඥා දීම ආදී විවිධ වැඩසටහන් ලොව පුරා ක්‍රියාත්මක කරන දිනයකි. තවත් වැදගත් කරුණක් වන්නේ 2020 වසරේ ලෝක මිහිතල දිනය එහි 50වෙනි සංවත්සරය සැමරීමයි.

## මෙම වසරේ තේමාව සහ එහි වැදගත්කම

2020 වසරේ ලෝක මිහිතල දිනයේ තේමාව “දේශගුණ විපර්යාස සඳහා ක්‍රියාත්මක වෙමු” (Climate Action) යන්නයි. මෙම සුවිශේෂීය තේමාව මගින් වර්තමානයේ ලොවම මුහුණදී ඇති දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම්වලට මුහුනදීම සඳහා ජගත් ප්‍රජාව ඒකරාශී කිරීමේ වැදගත්කම ඉස්මතු කිරීමත්, දේශගුණික විපර්යාසයන් ඇතිකිරීම සඳහා හේතුවන මානව ක්‍රියාකාරකම් අවම කිරිමටත් ජගත් අවධානය යොමුකර ඇත. නෛතික ප්‍රතිපාදන මගින් පමණක් දේශගුණික විපර්යාසයන් ඇතිවීමට හේතුවන කරුණු පාලනය කිරිමට පියවර නොගෙන ඒ සඳහා සමාජයේ සෑම ස්ථරයකම ජනතාවගේ දැනුවත් භාවය ඇතිකරමින් ඒ තුළින් පරිසර හිතකාමී ආකල්ප හා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනයට මෙම කාලෝචිත තේමාව වඩාත් වැදගත් වී ඇත.

දේශගුණික විපර්යාස සඳහා හේතු වන්නේ මානව ක්‍රියාකාරකම්ද නැතහොත් ස්වභාවික සිද්ධීන් ද යන්න පිළිබඳව විද්වතුන් අතර මතවාදයක් ඇතත්, ඒ අතරින් මානව ක්‍රියාකාරකම් දේශගුණික විපර්යාස සඳහා ප්‍රධාන වශයෙන් හේතුවන බව අනාවරණය වී ඇත. මේ අනුව, මිනිසාගේ ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයේ ඇති වායු

සංයුතියේ සිදුවන වෙනස්වීම් නිසා දේශගුණයේ ඇතිවන නොයෙකුත් වෙනස්වීම් දේශගුණික විපර්යාස ලෙස සරළව හැඳින්විය හැක.

2012 වසරේ කටාර් රාජ්‍යයේ  පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 18වැනි සමුළුව (COP-18)  මගින් කාබන්ඩයොක්සයිඩ් ($CO_2$), මීතේන් ($CH_4$), නයිට්‍රස් ඔක්සයිඩ් ($N_2O$),  හයිඩ්‍රොෆ්ලෝරෝකාබන් (HFCs), පර්ෆ්ලොරෝකාබන් (PFCs), සල්පර් හෙක්සාෆ්ලෝරයිඩ ($SF_6$) සහ නයිට්‍රජන් ට්‍රයිෆ්ලෝරයිඩ් ($NF_3$) යන වායු වර්ග “හරිතාගාර වායු” ලෙස ප්‍රකාශයට පත්කරන ලදී.  මෙම වායූන් වායුගෝලයේ ස්වභාවිකව පවතින වායූන් මෙන්ම කෘතිමව නිපදවා ඇති වායූන්වන අතර මෙම වායූන් සතුව හිරුගෙන් පැමිනෙන හෝ පෘථිවියෙන් පිටවන අධෝරක්ත කිරණ (තාප කිරණ) අවශෝෂණය කිරීමේ හැකියාවත් එලෙස අවශෝෂණය කරන ලද අධෝරක්ත කිරණ නැවත පරිසරයට මුදා හැරීමේ හැකියාවත් සතුය. වායුගෝලයට අධිකව මෙම හරිතාගාර වායූන් මුක්තවීම මගින් මිහිතලයේ උෂ්ණුසුම ඉහළයන අතර එමගින් දේශගුණික විපර්යාසයන් ඇතිකරනු ලබයි. වායුගෝලයට අධිකව එකතුවන කාබන් ඩයොක්සයිඩ් වායුව දේශගුණික විපර්යාස කෙරෙහි විශාල වශයෙන් දායක වන අතර එහිදී බලශක්තිය, විදුලිය සහ තාපය උත්පාදනය සඳහා ගල් අඟුරු සහ ඛණිජ තෙල් වැනි පොසිල ඉන්ධන භාවිතයත්, ප්‍රවාහන ක්ෂේත්‍රයේදී පොසිල ඉන්ධන දහනයත් අධික කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයක් වායුගෝලයට මුදාහරින ප්‍රභවයන්ය. මෙයට අමතරව කර්මාන්තශාලා, අවිධිමත් භූමි පරිහරණ රටාවන්, අවිධිමත් අපද්‍රව්‍ය කළමනාකරණය මෙන්ම වන හරණය හේතුවෙන් ද වායුගෝලයට අධික කාබන්ඩයොක්සයිඩ් වායු ප්‍රමාණයක් එකතු වේ.

ගෝලීය වශයෙන් වැඩිම කාබන්ඩයොක්සයිඩ් වායු ප්‍රමාණයක් වායුගෝලයට නිදහස්කරන රට චීනය වන අතර එම ප්‍රමාණය 28% ක් පමණය. මෙහි දෙවන හා තෙවන ස්ථානයන් පිළිවෙලින් ඇමරිකා එක්සත් ජනපදයට හා ඉන්දියාවට හිමිවන අතර එම ප්‍රමාණයන් 14% හා 7%කි.  වායුගෝලයට කාබන්ඩයොක්සයිඩ් නිදහස් කිරිමේ 5%ක දායකත්වයක් දක්වන රුසියාව මෙම ලේඛනයේ සිව්වන ස්ථානය දරන අතර 3%ක කාබන්ඩයොක්සයිඩ් වායු ප්‍රමාණයක් නිදහස් කරන ජපානය පස්වැනි ස්ථානයට පත්ව ඇත. කුඩා දිවයිනක් ලෙස ශ්‍රී ලංකාවේ සමස්ථ කාබන්ඩයොක්සයිඩ් නිදහස් කිරිම 0.1% කට වඩා අඩු අගයකි. (මූලාශය -https://www.worldometers.info/co2-emission )

වර්තමානයේ  මිනිසා විසින් සිදුකරන අධිපරිභෝජන ජිවන රටාව හේතුවෙන් පරිසරයට බැහැරවන අපද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගනී. මෙම රසායනික ද්‍රව්‍ය අතර පරිසරයට ඉතා හානිකර දිගුකල් පවතින කාබණික දූෂකාරකයන් ද පවතී. මෙසේ පරිසරයේ පවතින විවිධ හානිදායී රසායනික ද්‍රව්‍යවල ක්‍රියාකාරිත්වය ගෝලීය උෂ්ණත්වය ඉහළයාම මත වෙනස්වීමේ හැකියාවක් ද ඇත. එසේම පරිසරයට බැහැරවී ඇති විවිධ වර්ගයේ රසායනික ද්‍රව්‍ය එකිනෙක මිශ්‍රවී දැනට අනුමාන කල නොහැකි මට්ටමේ හානිකර බලපෑමක් ඇතිවීමට ද අවස්ථාව ඇත. එමෙන්ම, දේශගුණික විපර්යාස මගින් ඇතිවන විවිධ වෙනස්කම් හේතුවෙන් ඉහත රසායනික ද්‍රව්‍ය මගින් ජනිතවන බලපෑම ලොව විවිධ ප්‍රදේශ වලට ව්‍යාප්තවීමේ හැකියාවක් ද ඇත. මෙම කරුණු සැලකීමේදී දේශගුණික විපර්යාසයන් පිළිබඳව අප වැඩි අවධානයක් යොමුකල යුතු බව ඉතා පැහැදිලිය.

## දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම්

- වායුගෝලයේ උෂ්ණත්වය ඉහළයාම හේතුවෙන් ධ්‍රැව ප්‍රදේශ ආශ්‍රිතව පවතින ග්ලැසියර හා අයිස් තට්ටු දියවීයාම නිසා සාගරයේ ජල මට්ටම ඉහළ යාම. මෙම තත්ත්වය මත කුඩා දිවයින් සහ පහත්බිම් ජලයෙන් යටවීයාමේ අවදානමක් ඇත.
- දිගු නියං කාල ඇතිවීම හා ඉතා කෙටි කාලයක් තුළ අධික වර්ෂාවක් ලැබීම හේතුවෙන් ආපදා තත්ත්ව ඇතිවීම (නියඟය හා ගංවතුර). මේ හේතුවෙන් ජීවිත හා දේපල හානිවීම් මෙන්ම ස්වභාවික පරිසර පද්ධති හානියට පත්වීම ද සිදුවේ.
- දේශගුණික රටාවන් වෙනස්වීම හා ඇතිවන ආන්තික කාලගුණික තත්ත්වයන් (දිගුකාලීන නියං සහ ක්ෂණික ගංවතුර) හේතුවෙන් කෘෂිකර්මාන්තය වැනි දෛනික ක්‍රියාකාරකම් අඩාලවීම.
- කෘෂිකර්මාන්තයට ගැටළු ඇතිවිම හා පිරිසිදු පානීය ජලය සීමිතවීම මගින් ආහාර සුරක්ෂිතතාවයට හා සෞඛ්‍යයට ගැටළු ඇතිවීම.
- විවිධ රෝග පැතිරයාමේ අවදානම ඇතිවීම (උදා- ඩෙංගු, මැලේරියාව).
- කුණාටු හා වාසුළි තත්ත්ව සුලභව ඇතිවීම හා එමගින් සිදුවන ජීවිත හා දේපල හානි ඉහළයාම.
- ජීවී විශේෂයන්ගේ ව්‍යාප්තිය වෙනස්වීමට හේතුවීම හා ජීවී විශේෂ වඳවීයාමට හේතුවීම.

## දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් අවම කිරීම හා ඒ සඳහා අනුගතවීම

ශ්‍රී ලංකාව නිවර්තන කලාපයේ පිහිටි දූපත් රාජ්‍යයක්වීම හේතුවෙන් එය දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑමට ගොදුරුවීමේ ඉහළ විභවයක් සහිතය. වර්තමානයේදී දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන වර්ෂා රටාවේ ප්‍රභල වෙනස්කම්, දිගුකල් පවත්නා නියං තත්ත්ව මෙන්ම ඉතා සුළු කාලයක් තුළ අධික වර්ෂාවක් ලැබීම හේතුවෙන් ඇතිවන ක්ෂණික ගංවතුර වැනි තත්ත්වයන් මෙරට බොහෝ ප්‍රදේශවලින් වාර්තා වේ. අප වැනි රටක් දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම්වලට නිරන්තරයෙන් ලක්වීම ඉතා හානිදායක අතර එමගින් සමාජ, ආර්ථික, පාරිසරික ගැටළු රාශියක් ඇතිවීම නොවැලැක්විය හැකි කරුණකි. දේශගුණික විපර්යාසයන් සම්පූර්ණයෙන් නවතාලීමේ හැකියාවක් නොමැති අතර සිදුකල හැක්කේ එහි අහිතකර ප්‍රතිපල වැලැක්වීමට හෝ අවම කිරීමට පියවර ගැනීම හා ඒ සඳහා අනුගත වීමයි. අනුගතවීමේදී දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම් කෙරෙහි ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කරනු ලබයි. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ පාර්ශව රාජ්‍යක් වශයෙන් මෙන්ම "කියතෝ සන්ධානයේ" පාර්ශව රටක් වශයෙන් ශ්‍රී ලංකාව දැනටමත් දේශගුණික විපර්යාසයන්ට අදාළ පියවර රැසක් ගෙන ඇත. එමෙන්ම 2015 වසරේ එළිදක්වන ලද "පැරිස් ගිවිසුම" දේශගුණික විපර්යාසයන් පිළිබඳ අන්තර්ජාතික අවධානය වඩාත් ඉහළ නැංවීමට අවස්ථාවක් විය.

මෙම පසුබිම යටතේ 2020 වසරේ ලෝක මිහිතල දිනය දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑමෙන් මිහිතලය ආරක්ෂාකරගැනීම සඳහා අවධානය යොමුකර ඇත. වර්තමානයේදී ද දේශගුණික විපර්යාස හේතුවෙන් වසරකදී සැලකියයුතු ජීවිත හා දේපල හානි ලොව පුරා වාර්තාවන අතර එය ඉදිරියේදී තවදුරටත් තීව්‍ර වනු ඇත. මානව ක්‍රියාකාරකම් හේතුවෙන් හායනයට ලක්වූ මිහිතලය ස්වභාවිකවම නැවත සුවපත්වන සමයක අපට වඩාත් වගකීම් සහගත ලෙස හා පරිසර හිතකාමී ලෙස මිහිතලය වෙත අවධානය යොමුකිරීමට කාලය එළඹ ඇත. මානව ක්‍රියාකාරකම් මිහිතලයේ දරාගැනීමේ ධාරිතාවය ඉක්මවා ඇති බව COVID19 හේතුවෙන් වසා දැමූ නගරවලට ඉහළින් නැවත මතුවූ නිල් අහස අපට පසක්කර ඇත. එසේනම් අප සතු වගකීම වන්නේ ජීවයට නිවහනවූ අපේ මිහිතලය සුරැකීමට පියවර ගැනීමයි.

## ලෝක මිහිතල දිනයට අපිත් මෙසේ දායක වෙමු.

- දේශගුණික විපර්යාසයන්ට හේතුවිය හැකි ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් වෙමු .
- බලශක්තිය සංරක්ෂණයට පියවර ගැනිමු.
- හැකි සෑම විටම පොදු ප්‍රවාහන ක්‍රම භාවිතයට නැඹුරුවෙමු.
- පරිසර හිතකාමී බලශක්ති ප්‍රභව වෙත යොමු වෙමු.
- අහිතකර පරිසර තත්ත්වයන්ට ඔරොත්තුදීමේ හැකියාව සහිත බෝග වර්ග හා ජීවී විශේෂ සංරක්ෂණය කරමු. අදාළ ප්‍රදේශවලට හඳුන්වාදෙමු.
- ජීවී විශේෂයන්ගේ පැවැත්මට හානිකර ද්‍රව්‍ය (උදා- කෘෂි රසායන) භාවිතයෙන් වලකිමු/ අවම කරමු.
- පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කරමු.
- නිසි පරිදි කසළ බැහැර කරමු.
- හැකි සෑමවිටම පරිසර හිතකාමී භාණ්ඩ භාවිතා කරමු.
- පරිසර පද්ධතිවලට හානිවන ක්‍රියාකාරකම්වලින් වලකිමු.
- ස්වභාවික සම්පත් අධිපරිභෝජනය සීමා කරමු.
- ගෙවත්තේ, පාසලේ හෝ සුදුසු ස්ථානයන්හි නිසි පරිදි රුක් රෝපණය කරමින් රෝපණය කරන ලද ශාක නිසිපරිදි නඩත්තු කරමු.
- ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණයකර ජල සම්පත් කළමනාකරණය කරමු.
- වගකීමෙන් යුතුව පරිසර වින්දනය කරමු.
- පරිසරය පිළිබඳව නිසි පරිදි දැනුවත්වී හා අන්අයටත් එම දැනුම ලබාදෙමු.
- සරල දිවිපෙවතක් ඇතිකරගනිමු.

"සුවපත් මිහිතලයක් සඳහා අපේ දායකත්වය ලබාදෙමු."

විශේෂ ස්තුතිය - වසන්ත දිසානායක මහතා, අතිරේක ලේකම් (පරිසර ප්‍රතිපත්ති), පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය. අජිත් සිල්වා මහතා, අතිරේක ලේකම් (පරිසර සංවර්ධන), පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය, ආචාර්ය සුනිමල් ජයතුංග මහතා, අධ්‍යක්ෂ, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය. ආර්.එම්.පී. අබේකෝන් මහත්මිය, අධ්‍යක්ෂ, ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය. මහින්ද වේරහැර මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණ අංශය, පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය. දක්ෂිණී පෙරේරා මහත්මිය, සහකාර අධ්‍යක්ෂ, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය.

තොරතුරු ලෝක මිහිතල දින වෙබ් අඩවිය (www.earthday network), අන්තර්ජාලය හා දේශගුණ විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය මගිනි.

සටහන

ටී.එම්. අනුරුද්ධ තෙන්නකෝන්
සහකාර අධ්‍යක්ෂ (පරිසර සැලසුම් හා ආර්ථික)
පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය